## විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

**සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව**



# සිහිනයක් වගේ.... 3

දිවා ආහාරයෙන් පසුව ස්නේහා කාමරයට යන විට අකලංක සිටියේ තද නින්දකය. ස්නේහා කාමරයේ දොර අසළ සිට ඔහු දෙස බලා සිටියේ ය. දඩබ්බර තරුණයා කුඩා දරුවකු මෙන් නිදා සිටින හැටි දකිනවිට ඇගේ මුවේ මැ-වෙන්නේ මන්ද ස්මිතයකි.

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

"කෝටිපති පුතා යළිත් මැරබලය පෙන්වයි.. පහර කෑ ආරක්ෂක නිලධාරියාට අසාධ්‍යයි"

"දැන් තේරුණා නොද කාරණේ?" මේට්‍රන් ඇසුවා ය. ".. අපි ඕවා ගැන කතා කරන්න ඕනෙ නැහැ දුවේ.. ලොකු ලොක්කො කරන කරගන්න දේවල් තමයි ඔය.. අපට තියෙන්නෙ අපට දීල තියෙන රාජකාරිය කරගෙන ඉන්න එක විතරයි."

"අපේ රාජකාරිය ලෙඩ්ඩු බලා ගන්න එකනෙ මැඩම්.. මේ බොරු ලෙඩ්ඩු බලා ගන්න එකත් අපට අයිති ද?"

"ලෙඩ නෑ වගේ පෙනුණාට අපි වටේ ඉන්න ඔක්කොම ලෙඩ්ඩු තමයි ස්නේහා.. ඔය හැම දෙනාම ලෙඩ්ඩු"

ස්නේහා සිනාසුණාය.

"අපිටත් ලෙඩ ඇති එහෙනම්" ඒ සිනාවෙන්ම ඈ කීවා ය.

"අඩු වැඩි වශයෙන් හැමෝටම පොඩි පොඩි ලෙඩ තියනවා තමයි"

"මං නං හිතා හිටියෙ මං හරිම නිරෝගියි කියලයි.. ඒ වුණාට මැඩම් කියන විදිහට එහෙනම් මටත් ලෙඩ තියෙනවා"

"කඩිය වගේ දුවල පැනල වැඩ කළාට ඔයාටත් ලෙඩ තියෙනවා... ඔයාට තියෙන ලෙඩේ තමයි හැමෝටම ඕනෑවට වඩා කරුණාවන්ත වීම.. අනුකම්පා කිරීම.. ඒ ලෙඩ හරිම භයානකයි ස්නේහා.. විශේෂයෙන් මේ කොළඹදි.. "

"බලාගෙන යනකොට ඉන්න තැන අනුවත් ලෙඩ රෝග වල බලපෑම අඩු වැඩි වෙනවනෙ මැඩම්"

"ඒක තමයි දරුවෝ ඇත්ත .. පරිස්සම් වෙන්න ඕනෙ.. කල්පනාවෙන් වැඩ කරන්න ඕනෙ.. මේක කොළඹනෙ.. ගමේ වගේ නෙවෙයි.."

"ගමේ කියලත් දැන් ඒ හැටි වෙනසක් නැහැ මැඩම්.. හැම තැනම එකයි.. දුවේ පරිස්සම් වෙයන් කියල අපේ තාත්ත උදේ හවා මට අවවාද දෙන්නෙ ඒකනෙ"

"කියවල ඉවර නං පත්තරේ හංගලා තියන්න.. වෙන කවුරුත් ඒක දකින්න ඕනෙ නැහැ" සුනන්දා මැඩම් කියන්නේ ඇත්තය. මේවා මෙතැන වැඩ කරන වෙනත් අය දැනගන්නට සුදුසු නැති බව ස්නේහාටද වැටහෙයි. උන් ඉස්පිරිතාලය පමණක් නොව කොළඹද ගිනි තියන්නට දක්ෂය.

දිවා ආහාරයෙන් පසුව ස්නේහා කාමරයට යන විට අකලංක සිටියේ තද නින්දකය. ස්නේහා කාමරයේ දොර අසළ සිට ඔහු දෙස බලා සිටියේ ය. දඩබ්බර තරුණයා කුඩා දරුවකු මෙන් නිදා සිටින හැටි දකිනවිට ඇගේ මුවේ මැවෙන්නේ මන්ද ස්මිතයකි.

ඔහුට ගෙන එන ලද කෑම බන්දේසිය ඔහුගේ ඇඳ අසළ තල්ලු කරන කුඩා මේසය මත විය. ලෙඩෙකුට දෙන කෑම බන්දේසියක් වගේ නොව හෝටලයක කෑම බන්දේසියක් වැනි යයි ඇයට සිතෙයි. එයට අත තබලාවත්

